ශීර්ෂය - 206 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 26, දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමෙහි හර ශේෂය සහ භාණ්ඩාගාර පරිසණක මුද්‍රිත අනුව හර ශේෂය අතර 2004 වර්ෂයට පෙර සිට පැවත එන රු.444,761 ක වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.	අත්තිකාරම් “බී ” ගිණුමේ රු. 444,761.00 ක වෙනස 2004 වර්ෂයට පෙර සිට පැවත එන අතර, එම වෙනසට හේතුව භාණ්ඩාගාර පරිසණක මුද්‍රිත ගෙන්වා ගෙන පරීක්ෂා කළ නමුත් නිරවුල් කර ගැනීමට නොහැකි වී ඇති බවත්, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ සහාය ලබා ගෙන මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට තීරණය කර ඇති බවත් දන්වා තිබුණි.	වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුයි.

(ආ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 ඡේදය ප්‍රකාරව තවදුරටත් වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම්, ඒවා නිසි පරිදි හඳුනා ගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගැනීමට නොහැකි නම් තක්සේරු කළ අගයට ගිණුම් ගත කළ යුතු අතර 2018 නොවැම්බර්	ඉඩම් දෙකක අයිතිය මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බැවින් එම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. අනෙකුත් සියළු ගොඩනැගිලි පිහිටි ඉඩම්වල අයිතිය විධිමත් පරිදි පවරා ගැනීම සඳහා කඩිනම් පියවර ගනිමින් පවතින බවත්, අයිතිය	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයිතිය පැවරී ඇති වත්කම් පිරිවැයට හෝ තක්සේරු කළ අගයට ගිණුම්ගත කළ යුතු අතර තවදුරටත් අයිතිය පවරාගෙන නොමැති වත්කම්වල අයිතිය පවරාගෙන කඩිනමින්

	21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරවද වසර 2020 වන විට තම ආයතනය සතු සියළුම මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කර අවසන් කළ යුතු වේ. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ද දෙපාර්තමේන්තුව විසින් උපයෝජනය කරනු ලබන ගොඩනැගිලි සහිත ඉඩම් 06 ක් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	පවරාගත් වහාම තක්සේරු කටයුතු සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බවත් දන්වා තිබුණි.	ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි.
(ii)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයේ 2 ඡේදය අනුව දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැඟිලි රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර වාර්තා ලබාගත යුතු වුවද, විගණිත දින දක්වාත් තක්සේරු කර වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 04/2018 අනුව දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරාගෙන ඇති ඉඩම් දෙක (02) සඳහා තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත.	චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුයි.
(iii)	2022 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව සතුව වාහන 24 ක සංචිතයක් පැවතුන අතර එයින් එකතුව රු.5,000,000 ක තක්සේරු වටිනාකමක් සහිත වාහන 2 ක් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. දෙපාර්තමේන්තුව සතු ඉතිරි වාහන 22 අතරින් වාහන 21 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි.	තක්සේරු වටිනාකම රු. 5,000,000 ක් වූ වාහන දෙක මෝටර් කාර් වර්ගයේ රථ දෙකක් වන අතර එම වාහන අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මඟින් මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත. තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු අගයක් ලැබී නොතිබීමේ හේතුවෙන් දැනට දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන ඇති වාහන 22 අතුරින් එක් වාහනයක් ගිණුම් ගත කර නොමැති අතර, එම වාහනය අපහරණය කිරීමට නියමිත බවත්, මෙම වසර අවසන්වීමට ප්‍රථම අයිතිය පවරා	දෙපාර්තමේන්තුව වෙත අයිතිය පැවරී ඇති වාහන ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුයි.

නොගත් වාහනවල අයිතිය පවරා ගැනීමටත්, එම වාහන තක්සේරු කර ගිණුම් ගත කිරීමටත් කටයුතු කරන බව දන්වා තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
• 1.6.1 (අ)	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමෙහි හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂය අතර 2004 වර්ෂයට පෙර සිට පැවත එන රු.444,761 ක වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය.	1.6.1 (අ)
• 1.6.1 (ආ)	දෙපාර්තමේන්තුව විසින් උපයෝජනය කරනු ලබන වත්කම්වල අයිතිය පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.	1.6.1 (ආ) i ,ii,iii

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී නිසි කාර්යක්ෂමතාවයකින් හා සකසුරුවම්කමකින් සිදුකළ යුතු	2024 වර්ෂය තුළ පැවැත්වීමට සැලසුම් කර තිබූ රාජ්‍ය උත්සව ප්‍රමාද වී පැවැත්වීමට සිදුවීම හේතුවෙන් අදාළ වැය විෂයයන් සඳහා වෙන් වූ ප්‍රතිපාදන ඉක්මවා මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන	නිසි කාර්යක්ෂමතාවයකින් හා සකසුරුවම්කමකින් ඇස්තමේන්තු සැකසිය යුතුයි.

	වුවත්, වැය විෂයන් 08 කට අදාළව ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය හා සංශෝධිත ප්‍රතිපාදනය අතර වෙනස්වීම් සියයට 50 – 200 අතර අගය පරාසයක් ගෙන තිබුණි.	මාරු කර වියදම් දැරීමට සිදු වූ බව දන්වා තිබුණි.	
(ආ)	වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් නිසිලෙස සිදු නොකිරීම හා නිසි පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයක් හා මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.1,600,000 ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.	මූලධන වැය විෂය යටතේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කළ ද 1/2024 වියදම් පාලන චක්‍රලේඛය අනුව එම කාර්යය තාවකාලිකව සිදු කිරීම නවතන ලද බවත්, ප්‍රවාහන වැය විෂයය යටතේ 2023 වර්ෂයේ කාර්යාල නිලධාරීන් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් ප්‍රවාහන සේවා ආයතන වෙත ගෙවිය යුතුව තිබූ රු. 800,000 ආසන්න මුදල සඳහා කැබිනට් අනුමැතිය ලැබීමට ප්‍රමාදවීමෙන් මෙම ප්‍රතිපාදන දෙසැම්බර් 31 දිනට ඉතිරි වී ඇති බවත් දන්වා තිබුණි.	ප්‍රතිපාදන වෙන් කරවා ගත් කාර්යයන් වර්ෂය තුළ සිදුකළ යුතුයි.
(ඇ)	පුනරාවර්තන වැය විෂයයන් 10 ක් හා මූලධන වැය විෂයයන් 4 ක් වශයෙන් වැය විෂයයන් 14 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.255,100,000 ක ප්‍රතිපාදනයෙන් රු.232,331,970 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර එම ප්‍රතිපාදන ඉතිරි වීම අදාළ වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 50 සිට 99 දක්වා අගය පරාසයක පැවතුණි.	මූලධන වැය විෂයයන් යටතේ වැය විෂයයන් **4** කට අදාලව ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වුයේ ඇතැම් ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා දැමීම, ඇතැම් ඉදිකිරීම් වෙනුවෙන් බාහිර ආයතන වෙත ප්‍රතිපාදන නිදහස් කළ ද ඒවා උපයෝජනය නොකිරීම, ඇතැම් වැය විෂයයන් යටතේ අත්‍යාවශ්‍යම රාජකාරී පමණක් සිදුකිරීම හා මැතිවරණ කටයුතු පැවතීම නිසා සැලසුම් කළ ඇතැම් කාර්යයන් තාවකාලිකව කල් දැමීමට සිදුවීම නිසාය. පුනරාවර්තන වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන ඉතිරිවීම් වාර්තා වී ඇත්තේ රාජ්‍ය උත්සව හේතුවෙන් ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදුකිරීමට නොහැකි වීම, ජල විදුලිය සඳහා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්වී තිබීම, විශ්වකෝෂ කාර්යාලය සඳහා කුළී ගෙවීමට සිදු නොවීම, මෘදුකාංග නඩත්තු සිදු නොවීම බවත් දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී නිසි කාර්යක්ෂමතාවයකින් හා සකසුරුවම්කමකින් සිදුකළ යුතුයි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 211(i) සහ මු.රෙ.447 ප්‍රකාරව සියලුම බැරකම් ඒවා සිදු වූ වහාම බැරකම් ලේඛනයේ සටහන් කළ යුතු වුවත් 2024 වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 03 කට අදාළව 2025 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසවලදී ගෙවීම් වවුචර් 06 කින් ගෙවන ලද එකතුව රු.423,288 ක්, බැඳීම් හා බැරකම් ලේඛනයේ සටහන් කර මූල්‍ය ප්‍රකාශනවල බැරකම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම වවුචර්පත් විවිධ හේතූන් මත හා විවිධ ප්‍රායෝගික තත්ත්වයන් යටතේ 2024 දෙසැම්බර් මස ගිණුම සැකසීමට පෙර ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම සිදු වී ඇති බැවින් 2024 බැරකම් ලේඛනයට ඇතුලත් වී නොමැති නමුත් 2025 ට අදාළ වැය ලෙජරයන්හි 14 තීරයෙහි පෙර වර්ෂයේ බැඳීම ලෙස නිසි පරිදි සටහන් කර දක්වා ඇති බවත් දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තිය අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ ගණන්දීමේ නිලධාරියා විගණනය සාර්ථකව කර ගැනීම සඳහා වන සම්බන්ධීකරණ නිලධාරියා වේ.රාජ්‍ය මූල්‍ය පාලනය හා පරිපාලනය සඳහා අභ්‍යන්තර විගණක හා ගණකාධිකාරී තනතුරු විසින් සුවිශේෂී කාර්යයක් ඉටු කරනු ලබයි. අප දෙපාර්තමේන්තුව සඳහා වන අනුමත කාර්යය මණ්ඩලයේ අභ්‍යන්තර විගණක තනතුර හා ගණකාධිකාරී තනතුරෙහි පවතින	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

	සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට අවස්ථා ගණනාවකදී ඉල්ලීම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් දන්වා තිබුණි.	
(ආ)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයාගේ මඟපෙන්වීම යටතේ දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති අතර අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද සකස් කිරීමට සහ ඒ අනුව විගණන විමසුම් අවම කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම**	**අනුකූල නොවීම**		
		රු.			
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**				
	XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්තිය	631,385	සේවය අතහැර ගොස් ඇති සේවකයින්ගෙන් 7 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	හඳුනාගත් නිලධාරීන්ගේ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර ඇති බවත්, තොරතුරු අනාවරණය කර ගත හැකි ණය ශේෂයන් පිළිබඳව ඇපකරුවන් වෙත තොරතුරු දන්වා	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 පරිච්ඡේද විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි.

				ඇති බවත්, හඳුනාගත නොහැකි ණය ශේෂයන් කපා හැරීමට කටයුතු කරමින් පවතින බවත් දන්වා තිබුණි.	
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
•	මුදල් රෙගුලාසි 571	2,325,636	තැන්පත් කර වර්ෂ 2 – 8 ත් අතර කාල පරාසයක් වූ තැන්පතු ගිණුම් දෙකකට අදාළව රු. 2,325,636 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ඉදිකිරීම් අධ්‍යාපන සම්පූර්ණ කරන තෙක් තාවකාලිකව ගෙවීම් කිරීම නතර කරන ලෙසට උපදේශන සේවා ආයතනය මගින් උපදෙස් ලබා දී ඇති බැවින් රු. 2,283,266.72 තැන්පතු මුදල රජයේ ආදායමට බැර කර නැත. එසේම කලාකරු දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය අලුත් කිරීමට යෝජිත බැවින් එහි ප්‍රවර්ධන කටයුතු සඳහා තැම්පත් ගිණුමේ ඇති රු. 42,369.21 ක මුදල යොදා ගැනීමට සැලසුම් කර ඇති බැවින් එම මුදල ද 2025.12.31 දින දක්වා තැන්පත් ගිණුමේ රඳවා ගැනීමට තීරණය කර ඇති බව දන්වා තිබුණි.	ඉදිකිරීම් අධ්‍යාපන නොපමාව සම්පූර්ණ කරගෙන අදාළ නිරවුල් කිරීම සිදු කළ යුතුයි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරි සැලැස්මෙහි, කාර්ය සාධන දර්ශක වලට අනුව අපේක්ෂිත නිමවුම සංඛ්‍යාත්මක අගයක් ලෙස නිශ්චිතව දක්වා නොතිබුණි.	ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඇතැම් වැඩසටහන් සඳහා අපේක්ෂිත නිමවුම සංඛ්‍යාත්මකව දක්වා ඇති අතර 2025 වසරේ සිට ක්‍රියාකාරී සැලැස්මෙහි වැඩසටහන් සඳහා කාර්යසාධන දර්ශක වලට අනුව අපේක්ෂිත නිමවුම සංඛ්‍යාත්මකව දැක්වීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ක්‍රියාකාරි සැලැස්ම මාර්ගෝපදේශයට අනුව සකස් කළ යුතුයි.
(ආ)	කලාකරුවන් සඳහා ආධාර ගෙවීම යටතේ වෛද්‍යාධාර හා අවමංගල්‍යාධාර ගෙවීමේදී ආධාර අවශ්‍ය වන කලාකරුවන් වෙන්කර හඳුනා ගෙන එම කලාකරුවන් සඳහා පමණක් ආධාර ගෙවීම සිදුකළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර 2023 අප්‍රේල් 27 දිනැති අංක 04/2017(i) දරන දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛයක් මත පදනම්ව වෛද්‍යාධාර හා අවමංගල්‍යාධාර ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන සියළුම කලාකරුවන්ට ඔවුන්ගේ ආදායම් මට්ටම ගැන කිසිදු විමසීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි. ඒ අනුව විශ්‍රාම වැටුප් ලබන හා ජාතික තලයේ කලා කටයුතු වල ඉතා සක්‍රීය මට්ටමින් නියැලී සිටි ඉහළ ආදායම් ඉපයීමේ විභවතාවයක් සහිතව සිටි කලාකරුවන්ටද මෙම ආධාර ලබා දී තිබුණි.	දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017(1) අනුව කලාකරුවන්ට වෛද්‍යාධාර ලබා දීමේදී කලාකරුවන්ගේ ආදායම් මට්ටම හෝ ඔහු විශ්‍රාමලාභියෙකු ද යන වග සැලකිල්ලට ගනු නොලබයි. එහෙයින් වෛද්‍යාධාර අවශ්‍ය කලාකරුවන්ට ආධාර දෙනු ලබයි.	ආධාර අවශ්‍ය වන කලාකරුවන් හඳුනා ගෙන එම කලාකරුවන් සඳහා පමණක් ආධාර ගෙවීම සිදුකළ යුතුය.

(ඇ)	කලාකරුවන් සඳහා ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, කලාකරුවන්ගේ තොරතුරු ඇතුළත් තොරතුරු පද්ධතියක් සංස්කෘතික දෙපාර්තමේන්තු විසින් යාවත්කාලීනව පවත්වාගත යුතු අතර එම තොරතුරු පද්ධතිය මත පදනම්ව විවිධ ආධාර ව්‍යාපෘති සඳහා සුදුසු ප්‍රතිලාභීන් වෙන් කර හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද, ආධාර ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන් තීරණය කිරීමේ අවස්ථාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සිටින සංස්කෘතික විෂයභාර නිලධාරීන් වෙතම පැවරෙන පරිදි කටයුතු කර තිබීම හේතුවෙන් පුද්ගලානුබද්ධව තේරීම් කිරීමේ අවස්ථාවන් ඇතිවීමට හැකියාවක් ඇත.	සියලුම කලාකරුවන් ඇතුළත් වන පරිදි දත්ත පද්ධතිය සකස් කිරීමේ කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති අතර, ඉදිරියේදී ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එම දත්ත පද්ධතියේ තොරතුරු අදාළ කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා තිබුණි.	යාවත්කාලීන තොරතුරු පද්ධතියක් සකස් කල යුතුය.

4.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජෝන්ද සිල්වා සමරු රඟහල නවීකරණය කර සංවර්ධනය කිරීම අදියර දෙකක් යටතේ සැලසුම් කර තිබූ අතර පලමු අදියර 2014 වර්ෂයේදී ආරම්භ කර 2018 දී අවසන් කර තිබුණු අතර ඒ සඳහා රු.448,337,797 ක මුදලක් වැය කර තිබුණි. දෙවන අදියර ඉදිකිරීම් කටයුතු රු.1,567,353,048 ක (වැට් රහිත) මුදලකට වර්ෂයක කාලයක් තුළ (2021/12/09 – 2022/12/09) අවසන් කිරීමට යටත්ව අදාළ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර පසුව උපදේශන ආයතනයේ නිර්දේශය මත කොන්ත්‍රාත්	ජෝන්ද සිල්වා සමරු රඟහල නවීකරණ කටයුතු තාවකාලිකව නවතා දැමීම මත මෙම ප්‍රතිපාදන පූර්ණ ලෙස උපයෝජනය කිරීමට නොහැකි වී ඇත.	නවීකරණ කටයුතුවල කාර්යසාධනය සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාවලිය අඛන්ඩව සිදු කල යුතු අතර ඒ තුලින් අදාල තීරණ ගැනීමට පමා නොකල යුතු බව.

	කාලය 2023/04/30 දක්වා දීර්ඝ කර තිබුණද, අදාළ කාලය අවසන් වන විටත් ව්‍යාපෘතියේ ප්‍රගතිය 5.5% වීම මත 2024/09/10 දින අදාළ ගිවිසුම අවසන් කර එම කටයුතු තවකාලිකව නවතා තිබුණි. ඒ අනුව 2024 වර්ෂයේදී ජෝන්ද සිල්වා සමරු රඟහල සඳහා වෙන් කරන ලද රු.69,500,000 ක ප්‍රතිපාදන සියයට 100 ක් ඌණ උපයෝජිතව තිබුණි.		
(ආ)	2018 අගෝස්තු 29 දිනැති අංක 18/විවිධ(031) දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ආරම්භ කර තිබූ ජාතික කලාභවන ප්‍රතිසංස්කරණ කටයුතු අදියර දෙකක් යටතේ සිදු කිරීමට සැලසුම් කර තිබූ අතර ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් සෘජු පදනම මත මෙම කාර්යය ඉටු කර ගැනීමට අනුමත කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂයේදී ගොඩනැගිල්ලේ සිවිලිම සකස් කිරීම,විදුලි ආලෝකකරණය, ප්‍රධාන පිවිසුමේ වීදුරු වහල සැකසීම, තීන්ත ආලේප කිරීම හා වායු සමීකරණ පද්ධති සකස් කිරීම සඳහා රු.155,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද වර්ෂය තුළ එම කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණු අතර ප්‍රතිපාදන සියයට 91 ක් ඌණ උපයෝජිතව තිබුණි.	ජාතික කලාභවන නවීකරණ කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් සිදුකළ අතර එම කාර්යයන්ට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී හා කොන්ත්‍රාත්තු ප්‍රධානය කිරීමේදී සිදු වූ ප්‍රමාදවීම් හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාද විය. මේ හේතුවෙන් ප්‍රතිපාදන පූර්ණ ලෙස උපයෝජනය කිරීමට නොහැකි වී ඇත.	ඉදිකිරීම් කටයුතු සැලසුම්කල පරිදි ප්‍රමාදයකින් තොරව අවසන් කිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතු වේ.
(ඇ)	මිල කල නොහැකි උරුමයන් ප්‍රවර්ධනය හා සංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය (206-2-3-12-1409) යටතේ චිත්‍ර සංරක්ෂණය හා වැඩමුළු පැවැත්වීම සඳහා රුපියල් මිලියනයක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද වර්ෂය තුළ කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි.	චිත්‍ර සංරක්ෂණ වැඩමුළු පැවැත්වීම සඳහා අවශ්‍ය භාණ්ඩ නොමැති වූ බැවින් එම භාණ්ඩ ලබා ගැනීම සඳහා විදේශීය රටකින් එම භාණ්ඩ ඇනවුම් කරන ලද බවත්, එම භාණ්ඩ 2024 වසරේ දෙසැම්බර් මස ලැබුනු බැවින් වැඩමුළු පැවැත්වීමට	ප්‍රතිපාදනයන් සිදු කරන අවස්ථාවේදී ඊට අනුෂාංගික වූ අනෙකුත් කාරණා පිළිබඳ සැලකිලිමත් විය යුතුයි.

		නොහැකි වූ බවත් දන්වා තිබුණි.	
(ඇ)	සුභාවිත ගී වියමණ වැඩසටහන් දෙකක් පැවැත්වීම සඳහා රු. මිලියන 0.7 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද, වර්ෂය තුළ එක් ප්‍රසංගයක් පමණක් රු. මිලියන 0.326 ක වියදමක් දරා පවත්වා තිබුණි. ඒ අනුව රු. මිලියන 0.374 ක ප්‍රතිපාදන නිශ්කාර්යයව පැවතුණි.	සුභාවිත ගී වියමන වැඩසටහන් දෙකක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද සැලසුම් කළ කාල සීමාවේදී මැතිවරණ කිහිපයක් පැවතීම හා දෙපාර්තමේන්තුවේ රාජ්‍ය උත්සව පැවැත්වීමට සිදුවීම නිසා එක් ප්‍රසංගයක් පැවැත්වීමට නොහැකි විය.	සැලසුම් කල පරිදි කාර්යයන් ඉටුකල යුතුය.

4.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සංස්කෘතික සංගම් හා කලායතන මගින් වැඩසටහන් සිදු කිරීම සඳහා රුපියල් මිලියනයක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණද, එම ක්‍රියාකාරකම් නිශ්චිතව සඳහන් කර නොතිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාව අනුව වර්ෂය තුළ කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි.	206-02-03-06-1409 වැය විෂයය යටතේ ප්‍රාදේශීය සංස්කෘතික සංගම් හා කලායතන මඟින් සිදු කරන වැඩසටහන් සඳහා 2024 වර්ෂයට අදාළව රු. මිලියනයක ප්‍රතිපාදන වෙන් කරන බවත්, මෙම වැඩසටහන යටතේ ක්‍රියාකාරම් නිශ්චිතව සඳහන් කළ නොහැකි අතර සංස්කෘතික සංගම් හා කලායතනවලින් ඉල්ලීමක් ලද හොත් පමණක් වියදම් දරණු ලැබේ. 2024 වර්ෂය තුළ මෙම වැඩසටහනට අදාළව කිසිදු ඉල්ලීමක් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වී නොතිබූ බව දන්වා තිබුණි.	අපේක්ෂිත කාර්යයන් හඳුනාගෙන ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතුයි.
(ආ)	ආධාර අවශ්‍ය වන කලාකරුවන් සඳහා ආධාර ගෙවීම යටතේ අගහිඟ කලාකරුවන් සඳහා ආධාර ගෙවීමට රු. මිලියන 32.5 ක මුදලක් වෙන් කර තිබුණද, වර්ෂය තුළ රු. මිලියන 29.68 ක මුදලක් පමණක් එම	සෑම වර්ෂයකම අයදුම්පත් විශාල සංඛ්‍යාවක් ලැබුණ ද එම අයදුම්පත්වල පවතින අඩුපාඩු හේතුවෙන් නිවැරදි කර එවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට නැවත යොමු කරන අයදුම්පත් නැවත ලැබීමට ප්‍රමාදවීම හේතුවෙන් අදාළ	පරීක්ෂා කර බලා අයදුම්පත් ලබා ගැනීමට ක්‍රමවේදයක් සැකසීම හා ප්‍රතිපාදිත මුදල වර්ෂයේදී උපයොජනය කිරීම කෙරෙහි අවධානය යොමුකල යුතු වේ.

කාර්යයට යොදවා තිබුණි. දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කරන අයදුම්පත් පරීක්ෂා කර බලා මෙම ආධාර ක්‍රමයට ඇතුළත් කිරීම සඳහා දෙමළ භාෂා හැකියාව සහිත නිලධාරියෙකු නොමැති වීම මත දෙමළ භාෂා මාධ්‍යයෙන් අයදුම්පත් ඉදිරිපත් කරන අගහිඟ කලාකරුවන් අසාධාරණයට පත්ව තිබුණි.	වර්ෂය තුළ ගෙවීම් කිරීමට නොහැකි අවස්ථා පැවතුණි. මෙම ගැටළුව නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ප්‍රාදේශීය ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී අදාළ නිලධාරීන් වෙත මේ වන විට ලබා දී ඇත. දෙමළ මාධ්‍යය නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් යම් ප්‍රමාදයක් සිදුව ඇත.

4.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාර්යසාධන දර්ශක හා එහි අපේක්ෂිත ඉලක්ක ප්‍රමාණය ක්‍රියාකාරී සැලැස්ම මගින් ස්ථාපිත කර නොතිබූ බැවින් කාර්යසාධන වාර්තා කෙටුම්පතේ දක්වා තිබුණු කාර්යසාධන දර්ශක 4ක් හා එහි ළඟාකරගැනීම් ප්‍රතිශතය ලෙස දක්වා තිබුණු අගයන්වල නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.	දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් කාර්යසාධන දර්ශක 04 හා එහි ළඟා කරගැනීමේ ප්‍රතිශතය ට අදාලව තත්‍ය නිමැවුමට අදාල ප්‍රතිශතය ගණනය කරන ලදී. ඉදිරි වසරේ සිට එය තවදුරටත් තහවුරු වන ආකාරයට දැක්වීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	කාර්යසාධන දර්ශක හා එහි අපේක්ෂිත ඉලක්ක ප්‍රමාණය නිවැරදිව දැක්විය යුතුයි.
(ආ)	ශබ්දකෝෂ, විශ්වකෝෂ හා වෙනත් මුද්‍රණය කිරීම (වැය විෂයය 206-2-2-1-1409) සඳහා රු.2,500,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර කෙටුම්පත් කාර්ය සාධන වාර්තාවෙහි 1.5.4	මෙහි ඉලක්කගත සිංහල විශ්වකෝෂ කාණ්ඩ ප්‍රමාණය 20 ක් වේ. නිකුත් කර ඇති සිංහල විශ්වකෝෂ කාණ්ඩ 13 ක් ලෙස සටහන් වී ඇත්තේ මුද්‍රණ දෝෂයකිනි. එහෙත් මේ වන විට විශ්වකෝෂ භාණ්ඩ 14 ක් නිකුත්	ඉලක්කගත විශ්ව කෝෂ කාණ්ඩ ප්‍රමාණය නිකුත් කිරීමට කටයුතු කළ යුතුයි.

ඡේදය ප්‍රකාරව ඉලක්කගත විශ්ව කෝෂ කාණ්ඩ ප්‍රමාණය 20ක් වූ අතර 2014 වර්ෂය වන විට කාණ්ඩ 14 ක් පමණක් නිකුත් කර තිබූ අතර අවසන් කාණ්ඩය නිකුත් කර වසර 9 ක් ඉකුත් වී තිබුණද ඊළඟ කාණ්ඩය මේ දක්වා නිකුත් කර නොතිබුණි.	කර ඇත. ඒ අනුව අවසන් වරට විශ්වකෝෂ කාණ්ඩයක් මුද්‍රණයෙන් එළිදක්වා ඇත්තේ වසර 06 කට පෙරයි. සිංහල විශ්වකෝෂය අන්තර්ජාලයේ මාර්ගගත විශ්වකෝෂයක් වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වසරේ තීරණය කර ඇත. ඒ අනුව සිංහල විශ්වකෝෂයේ පළමු කාණ්ඩය සහ දෙවන කාණ්ඩය සම්පූර්ණයෙන්ම අන්තර්ජාලගත කර ඇති අතර තෙවන සහ සිව්වන කාණ්ඩ අන්තර්ජාලගත කරමින් පවතින බව දන්වා තිබුණි.	

4.5 කළමනාකරණ දූර්වලතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ජෝන් ද සිල්වා සමරු රඟහල නවීකරණය කර සංවර්ධනය කිරීමේ අදියර I ට අදාළ කොන්ත්‍රාත්කරු විසින් වසර 03 ක කාල ප්‍රමාදයක් සහිතව එනම් 2018 නොවැම්බර් 24 දින ඉදිකිරීම් කටයුතු අවසන් කර ගොඩනැඟිල්ල භාර දී තිබුණ ද, ප්‍රමාද ගාස්තු ලෙස අයකරන ලද රු.38,658,734 ක මුදල නිසි අනුමැතියකින් හා සාධාරණ කරුණු තහවුරු කර ගැනීමකින් තොරව නැවත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර එම මුදල නැවත ගෙවන ලෙස 2021 මැයි 10 දින කොන්ත්‍රාත්කරුට දැනුම් දී තිබුණ ද 2025 මැයි 31 දින වන විටත් එම මුදල අයකර ගෙන නොතිබුණි.	ජෝන් ද සිල්වා සමරු රඟහල නවීකරණයට අදාළව කොන්ත්‍රාත්කරු වෙත නැවත ගෙවන ලද ප්‍රමාද ගාස්තුව නැවත අයකර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දෙන ලදුව, කොන්ත්‍රාත්කරු විසින් ඒ සම්බන්ධයෙන් බේරුම්කරණයට යොමු වී ඇත. එහිදී ප්‍රතිහිමිකම් ඉල්ලීමක් (Counter Claim) ලෙස ද මෙම මුදල් ගෙවන ලෙස ඉල්ලා ඇත. මෙම බේරුම්කරණය මෙතෙක් අවසන් වී නොමැති අතර, එහි තීරණ අනුව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	ගෙවීම් කිරීමේදී නිසි අනුමැතියකින් හා තහවුරු කර ගැනීමකින් පසු ගෙවීම් කිරීමට වගබලා ගත යුතු අතර අදාළ මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය අනුව අමාත්‍යාංශයක් යටතේ ඇති එක් එක් දෙපාර්තමේන්තුව සඳහා එහි ගණන්දීමේ නිලධාරි විසින් එම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණකවරයෙකු පත් කර නොමැති අවස්ථාවක ජාතික විගණන පනත ක්‍රියාත්මක වීමේ දින සිට වසර දෙකක් නොඉක්මවන කාලසීමාවක් තුළ එම පත් කිරීම සිදු කල යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2017.02.09 දිනැතිව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 111/11 ශ්‍රේණියේ තනතුරක් ලෙස අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර ඇතත් මේ දක්වා එම තනතුර පුරප්පාඩුව පවතින බැවින් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට නොහැකි වී ඇත. අභ්‍යන්තර විගණන තනතුරට නිලධාරියෙක් පත්කළ වහාම අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කිරීමට කටයුතු කරන බවත්, එතෙක් බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් අනුව අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක යටතේ මෙම දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති බවත් දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය අනුව කටයුතු කළ යුතුයි.